## 22. ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය

### 22.1 විගණන විෂය පථය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 05 දින කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 22.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**22.3 විගණන නිරීක්ෂණය**

**---------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 22.4 සිට 22.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
| --- | --- |
| පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------------------**

විෂය අංක 02201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.62,987 ක් විය.

**22.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------  --**

**22.4.1 අභ්‍යන්තර විගණනය**

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**22.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**22.5 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවන පරිදි වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.39,220 ක බැරකම්වලට එළඹ තිබුණි.

**22.6 කාර්යසාධනය**

------------------

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත ලැබී තිබුණු 2012 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ පැමිණිලි සංඛ්‍යාව 682 ක්ද , 2013 වර්ෂයේ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 1,482 ක්ද වශයෙන් මුළු පැමිණිලි සංඛ්‍යාව 2,164 ක් සමාලෝචිත වර්ෂයේදි විමර්ශනය කිරිමට තිබුණි. සමාලෝචිත වර්ෂයේදි පැමිණිලි 131 කට නිර්දේශය ලබා දි තිබුණු අතර, සුදුසු කටයුතු සඳහා වෙනත් ආයතන වෙත යොමු කරන ලද ලිපිගොනු 127 ක්ද , මැදිහත් විය නොහැකි ලිපිගොනු 192 ක්ද වශයෙන් ලිපිගොනු 450 ක කටයුතු අවසන් කර තිබුණි.

**22.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | – |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 18 | 10 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 02 | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | එකතුව | **30** | **15** | **15** |